මුදල් මණ්ඩලය

ශ්‍රී ලංකා මහ බැංකුව

2020 මාර්තු 24 | චක්‍රලේඛය | 2020 අංක 04

# කොවිඩ්-19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැළසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග

දැනට පැතිරයන කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා අගතියට පත් පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහයක් වීම සඳහා සහන සැපයීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස අති ගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව, 2020.03.20 වන දින පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී කැබිනට් ඇමතිවරුන් විසින් ගන්නා ලද තීරණයන්ට සමගාමීව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මෙයින් මතුවට මූල්‍යායතන ලෙස සඳහන් කෙරෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලීසිං සමාගම් සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. පෙර සඳහන් සියළු මූල්‍යායතන විසින් ප්‍රාග්ධනය හා පොලිය ඇතුලත් ව ණය ගෙවීම් සඳහා සහන කාලයක් පහත පරිදි ලබා දිය යුතුය:
   - අ. ස්වයං-රැකියා ලෙස සේවයේ නිරතු සියළු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා කුඩා රථ සහ බස් රථ වල ලීසිං වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්;
   - ආ. පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්;
   - ඇ. රුපියල් මිලයනයට අඩු මුළු ණය වටිනාකමකින් යුතු සියළුම පුද්ගල ණය සහ ලීසිං වාරික සඳහා මාස තුනක සහන කාලයක්; සහ
   - ඈ. අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිළි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත කාර්යය සම්පාදන සේවා සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.

2. මූල්‍යායතන විසින් ඉහත 1 (ඈ.) හි සඳහන් ක්ෂේත්‍රයන් හට 4% පොළී අනුපාතිකයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සහ අවම වශයෙන් මාස හයක කාල සීමාවක් සඳහා පොළී ගෙවීම් කපා හැරීමක් ලබා දිය යුතු අතර ප්‍රතිමූල්‍යනයේදී පොළී සහනාධාරයක් හිමි වනු ඇත.

3. ඉහත 1 හා 2 සඳහන් කාරණා සඳහා ගනුදෙනු කරුවන් හට 2020.04.30 වන දින තෙක් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මූල්‍යායතන විසින් ඉඩ ලබා දිය යුතු අතර මූල්‍යායතන විසින් ඒ පිළිබඳ කටයුතු දින 45ක් තුල දී සිදුකර අවසන් කළ යුතුය.

4. මූල්‍යායතන විසින් රුපියල් 50,000 දක්වා දේශීය ණයපත් ගනුදෙනු සඳහා අයකරනු ලබන පොළිය 15% ක උපරිමයකට යටත් කල යුතු අතර ණයපත් සඳහා මාසිකව ගෙවිය යුතු අවම මුදල 50% කින් අඩු කළ යුතුය. එමෙන්ම, ණය සීමාව රුපියල් 50,000 දක්වා වන ණයපත් ආපසු ගෙවීමේ කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.

5. බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් 500,000 ට අඩු වටිනාකමකින් යුතු චෙක්පත්වල වලංගු කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.

6. බලපත්‍රලාභී බැංකු වල සියළුම ශාඛා ඇඳිරි නීතිය නොපවතිනා දිනයන් හිදී පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා අවම සේවක ප්‍රමාණයක් සහිතව විවෘතව තැබිය යුතු අතර ආහාර, ඖෂධ, සංචාරක සහ අනෙතුත් ගනුදෙනුකරුවන්ගේ අන්තර්ජාතික ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා ආයතනික ශාඛාවන් ඇඳිරි නීතිය පවත්නා දිනයන් හිදී ද විවෘතව පැවතිය යුතුය.

7. ඉහත සඳහන් කරුණු පිළිබඳ විස්තරාත්මක උපදෙස් 2020.03.27 වැනි දින නිකුත් කරනු ඇත.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**

*මුදල් මණ්ඩලයේ සභාපති සහ*

*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*